## ව්‍යාපාරයන්ගෙන් අයකරනු ලබන ගාස්තු (බදු)

**ව්‍යාපාරයක් යනු කුමක්ද?**

කිසියම් ලාභයක් ඉපැයීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබන භාණ්ඩ හෝ සේවා හුවමාරු ක්‍රියාවලියක් ව්‍යාපාරයක් වේ.

පළාත් පාලන ආයතනයක් විසින් තම බලසීමාව ඇතුළත පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයකින් පසු එම ව්‍යාපාර ප්‍රධාන වශයෙන් කොටස් ත්‍රිත්වයකට බෙදනු ලැබේ.

1. වෙළඳ බලපත්‍ර ගාස්තුවකට යටත් කරනු ලබන ව්‍යාපාර
2. කර්මාන්ත බද්දකට යටත්කරනු ලබන ව්‍යාපාර
3. ව්‍යාපාර බද්දට යටත්කරනු ලබන ව්‍යාපාර

**වෙළඳ බලපත්‍රගාස්තුවකට යටත්කරනු ලබන ව්‍යාපාර**

බළන්ගොඩ නගර සභා සීමාවේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයන් අතුරින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් හෝ ඒ යටතේ පනවා ඇති අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූලව කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අදාළ වර්ෂයට වෙළඳ බලපත්‍රයක් ලබාගත යුතු වූ විට ඒ සඳහා ලබාගත යුතු බලපත්‍රය වෙළඳ බලපත්‍රය වේ. ඒ සඳහා පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු ගාස්තුව වෙළඳ බලපත්‍ර ගාස්තුව වේ.

**වෙළඳ බලපත්‍රයක් ලබා ගත යුත්තේ ඇයි?**

- බල සීමාවන් ඇති සියලු ව්‍යාපාරයන් පවත්වාගෙන යාම,පාලනය කිරීම,පරිපාලනය කිරීම,අධීක්ෂණය කිරීම.
- නෛතික අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා
- වෙළඳ ව්‍යාපාරය මහජන සෞඛ්‍යයට හිතකර අයුරින් පවත්වාගෙන යන්නේදැයි තහවුරු කර ගැනීමට වෙළඳ බලපත්‍රය අදාල වර්ෂයට ලබාගෙන තිබිය යුතු ය.
- වෙළඳ බලපත්‍රයක් ලබා ගන්නා ආකාරය
- කාර්යාලයෙන් ලබා දෙනු ලබන අයදුම් පත නිවැරදිව සම්පූර්ණ කර බාර දීම
- ආදායම් පරීක්ෂක නිළධාරි හා මහජන සෞඛ්‍ය පරීක්ෂක හා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි නිර්දේශය ලබා ගැනීම
- සභාපති/ලේකම්ගේ අනුමැතිය මත ගාස්තු අය කර වෙළෙඳ බලපත්‍රය නිකුත් කිරීම.

**වෙළඳ බලපත්‍රයක් ලබා නොගත් විට**

- සාපරාධී හෝ නීතිවිරෝධී ව්‍යාපාරිකයෙකු වේ.
- ප්‍රාදේශීය සභා අඥා පනත යටතේ චෝදනා ඉදිරිපත් කිරිම හා එම ව්‍යාපාරය වසා දැමීමට මහේස්ත්‍රාත් අධිකරණය විසින් සමාප්ති අඥාවක් ලබා ගැනීමට කටයුතු කිරිම.

**වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීමේ වාසි**

- සාපරාධී හෝ නීතිවිරෝධී ව්‍යාපාරිකයෙකු නොවීම.
- ගුණාත්මක හා සෞඛ්‍යාරක්ෂිත බවින් යුතු සේවාවක් පොදු ජනතාවට සපයනු ලබන බවට පිළිගැනීම ඇති වීම.

**කර්මාන්ත බද්ද සහ ව්‍යාපාරික බද්ද**

ව්‍යාපාරික ස්ථාන පිළිබඳව කරනු ලබන සමීක්ෂණයෙන් පසු බලපත්‍රයන්ට යටත්කළ යුතු ස්වභාවයේ ව්‍යාපාරයන් වෙන්කර ඉන් අනතුරුව කර්මාන්ත ස්වභාවයේ ව්‍යාපාරයන් වෙන්කරනු ලැබේ. එසේ වෙන්කිරීමෙන් පසු ඉතිරිවන සියලුම ව්‍යාපාරයන් වාර්ෂික ව්‍යාපාරික බද්දට යටත්කරනු ලැබේ.

**මේ සඳහා පවතින නෛතික තත්ත්වය**

- ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන පරිදි මහ සභා යෝජනා මඟින් ඉදිරි වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ගාස්තු/ කර්මාන්ත බදු/ ව්‍යාපාරික බදු පැනවීම කරනු ලැබේ.
- එම යෝජනා ඇතුළත් ගැසට් නිවේදන ඉදිරි වර්ෂය වෙනුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ දී පළ කිරීම කරනු ලැබේ.
- ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කුමන ආකාරයේ හෝ සෑම ව්‍යාපාරික ස්ථානයක්ම ඉහත සඳහන් වෙළඳ බලපත්‍ර ගාස්තුවට හෝ කර්මාන්ත බද්දට හෝ ව්‍යාපාරික බද්දට යටත් වේ.